# අපරාධ වාර්තාකරණය සහ සමාජීය බලපෑම පිළිබඳ අධ්‍යයනයක් (වැලිකඩ බන්ධනාගාරය ඇසුරින්)

ඩබ්.ඒ.කේ.යූ.ඒ. ලක්මාලි[1]

මිනිසුන් වෙත තොරතුරු සම්ප්‍රේෂණය කරන ක්‍රම අතරින් සන්නිවේදන මාධ්‍යයන් වැදගත් වේ. ඒ අතරින් ජනමාධ්‍ය ආයතන වලට වැදගත් ස්ථානයක් හිමි වේ. ලංකාව තුළ තිස් වසරක කාලයක් පැවති යුද්ධය නිමා වුව ද, රූපවාහිනී, පුවත්පත් වාර්තාකරණය තුළ දක්නනට ලැබෙන විවිධ අපරාධ සම්බන්ධ පුවත් අතරින් එකම ස්වරූපයේ අපරාධ වාර්තා දිනෙන් දින ඉහළ යාමක් පසුගිය කාල පරාසය තුළ දක්නට ලැබිණි. අපරාධ වාර්තාකරණය සමාජ අපගාමී චර්යාව කෙරෙහි බලපාන්නේ කෙසේද? යන්න පිළිබද අවධානයට ලක් කරමින් වැලිකඩ බන්ධනාගාරය ඇසුරින් දත්ත දායකයින් 60 දෙනෙකු යොදා ගනිමින් ප්‍රශ්නාවලී ශිල්ප ක්‍රමය ඔස්සේ දත්ත දායකයින්ගෙන් මූලික තොරතුරු ලබා ගත් අතර, සිද්ධි අධ්‍යයනය ඔස්සේ ගුණාත්මක දත්ත විශ්ලේෂණය කෙරිණි. ඒ අනුව මෙම අධ්‍යයනය තුළින් අපරාධකාරී චර්යාවන් ඇති වීමට අපරාධ වාර්තාකරණය බලපෑමක් වන බව නිගමනය කළ හැකි විය.

මුඛ්‍ය පද - අපරාධ, වාර්තාකරණය, අපගාමී චර්යාව

---

[1] සහකාර කථිකාචාර්ය සමාජ විද්‍යා අධ්‍යයන අංශය සමාජීය විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය